# 1.19 සිංහල ළමා ක්‍රීඩාවන්හි ප්‍රභවය පිළිබඳ විමර්ශනයක්

(ඓතිහාසික, සමාජ, සංස්කෘතික පසුබිම පිළිබඳ විශේෂ අවධානයෙන්)

ඒ. එල්. එන්. පුෂ්පමාලි පෙරේරා
සිංහල අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

## ABSTRACT

ජනශ්‍රැතිය වූකලී සරලව ''ජනතාව අතර ගොඩනැගී මුඛ පරම්පරාගතව පැවත එන ඥාන පරම්පරාව'' වේ. ගද්‍යයෙන් හෝ පද්‍යයෙන් නිර්මාණය වී පොදු ජන රුචියෙහි එකගතාව මත මුඛපරම්පරාගතව පැවත එන අතර යම් අවස්ථාවක පොදු ජන රුචියෙහි වෙනසක් සිදුවේද එසේ වෙනස් වන්නා වූ පොදු ජන රුචියට අනුරූපීව සකස්වෙමින් විකාශනය වීම සිදුවේ. පුළුල් අර්ථයෙන් ජනශ්‍රැතිය බහු ප්‍රබේද වේ. එම බහුවිධ ප්‍රබේද අතර 'ජන ක්‍රීඩා' ඒක දේශයකි. ප්‍රාදේශීය අවකාශය, සංස්කෘතිය හා තරග විලාශය පදනම් කර ගනිමින් මේවා වර්ග කළ හැකිය.

- එළිමහන් ජන ක්‍රීඩා
- ගෘහස්ථ ජන ක්‍රීඩා
- ත්‍රාසජනක ජන ක්‍රීඩා
- සතුන් මුල්කරගත් ජන ක්‍රීඩා
- අභිචාරාත්මක ජන ක්‍රීඩා වශයෙනි.

'සිංහල ළමා ක්‍රීඩා' අතුරින් බහුතරය යථෝක්ත වර්ගීකරණයෙහි 'එළිමහන් ජන ක්‍රීඩා' ගණයට ඇතුළත් වේ. විනෝදය, වින්දනය, දැනුම, තර්කානුකූලව සිතීමේ හැකියාව, ප්‍රශ්නවලට විසඳුම් සෙවීමේ දී කලබල නොවී කල්පනාකාරීව සිටිය යුතු බව හැඟවීම, ඉන්ද්‍රිය සංවරය, ශාරීරික සෞඛ්‍යය මනාව පවත්වාගෙන යෑම, මෙහි දී අපේක්ෂිත අරමුණු වුව ද ළමා ක්‍රීඩාවන්හි භාවිත සැහැලි කී සංවාද, දෙබස් හා ක්‍රීඩා විලාශය විමර්ශනය කිරීමේ දී ඒවා ආකාස්මිකව පහළ වූවක් නොවන බව විද්‍යාමාන වේ. සිංහල ළමා ක්‍රීඩා පිළිබඳ විමර්ශනය කර ඒවායෙහි ප්‍රභවය කෙරෙහි බලපෑ ඓතිහාසික, සමාජ, සංස්කෘතික පසුබිම අනාවරණය කරගැනීම මෙහිදී අපේක්ෂිතය.